# මම දෙමළ

වීරසේනගෙ වැඩ තහනමට
රෙදි මෝලේ ගිනිගහන ඉර යට
උගුර ලේ රහ වෙනකම්ම
කෑ ගගහ පිකටින් ඇවිළුව
මම දෙමළ.
වීරෙට වැඩ ලැබුනු පණිවිඩයට
'නඩේ සහෝදරයට ජයවේවා'
රජෙක් සේ උඹලා උස්සන් ගිය
මම දෙමළ.

වෙඩි තිබ්බ වැඩ වැරුමට
වෙඩි වැදුනු සිරිපාලව
අත් දෙකෙන් උස්සන්
හුස්මට දෙකට
මහ රෝහලට පියාඹපු
මම දෙමළ.
සේලයින් වැල් ඇමිණුව ඇඳ ලඟ
'නඩේ මම ණයයි පණ බේරුවට'
සිරා බදාගෙන ඇඬුව
මම දෙමළ.

රෝහලෙන් ඉල්ලුවෙ නැහැ
සිංහල ලේ
ගැබ්බර කුසුමට පණ අදින.
ලියලා තිබුනෙ ඇඳ ඉහපත
'ඕ නෙගටිව්'
මට විතරක් තිබුන
මම දෙමළ.
හැල්ලුව ලත් සැණින
'පුතේ උඹ අයිති නඩේ මාමට'
පොඩි එකා මගෙ අතට දුන්නට
මම දෙමළ.

වීරෙ උඹේ අඬ ඇහෙනවා
පිකටින් කරන
දෙමළු මරල හරි
සාමය ඕනැයි කියන.
සිරෝ ඉස්පිරිතාලයක් නැහැ මට
ෂෙල් වලට කුඩු වුනු
සමතලා ගල්කැලි බිල්ඩිම මිස.
කුසුමියේ
'ඕ නෙගටිව්' ලේ
ගලනවා හතර අත
උරන්නෙත් නැහැ
වටිනකමක් දන්නැති
ගල් කාශ්ඨක පොළොවට.

සනුහරේ අමු සොහොණ ලඟ
දරු මුණුපුරන් යායට මැරුණ
පණ අදිනවා මම දැං තනියම
මම දෙමළ.

**මහේෂ් මුණසිංහ**
2009 මැයි